ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2012/12/26 |

## ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය

ශ්‍රී ලංකාවේ සහ එහි සෑම පළාතකම සමස්ත සෞභාග්‍යමය තත්ත්වය තක්සේරු කිරීම සඳහා වූ සංයුක්ත දර්ශකයක අවශ්‍යතාව සපුරාලීම පිණිස 2008 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය, රටෙහි සහ සියලුම පළාත්වල ආර්ථික හා සමාජීය සංවර්ධනය වාර්ෂිකව පිළිබිඹු කරන බහුමාන දර්ශකයකි. මෙම දර්ශකය උප දර්ශක 3 කින් සමන්විත වන අතර ඒවා, ආර්ථික හා ව්‍යාපාරික පරිසරය පිළිබඳ උප දර්ශකය, ජන ජීවිතයේ යහපැවැත්ම පිළිබඳ උප දර්ශකය හා සමාජ ආර්ථික යටිතල පහසුකම් පිළිබඳ උප දර්ශකය ලෙස නම් කරනු ලබයි. මෙම උප දර්ශක 3 හි ක්‍රියාකාරිත්වය, විචල්‍යයන් 26 ක් භාවිතයෙන් මනිනු ලබයි. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයෙහි සෑම උප දර්ශකයකටම සමාන බර තැබීමක් සිදුකර ඇති අතර, එම උප දර්ශක මැනීම සඳහා භාවිතා කළ විචල්‍යයන් සංඛ්‍යා සටහන 7 හි සඳහන් කොට ඇත.

ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය මගින් ජාතික ප්‍රතිපත්ති සම්පාදකයන්ට, ප්‍රාදේශීය අධිකාරිවලට සහ ව්‍යාපාර හා ප්‍රජා කොටස්කරුවන් සඳහා වඩාත් පරිපූර්ණ

දර්ශකයක් සැපයේ. පළාත්වල ප්‍රබලතාවයන් හා දුබලතාවයන් හඳුනා ගැනීමටත්, උසස් තත්ත්වයන් ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනයටත් සහ ප්‍රාදේශීය විෂමතාවන් අඩුකර ගැනීමටත් ඒ තුළින් රටේ සමබර සංවර්ධනයට මගපෙන්වීමටත් ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය භාවිතා කළ හැක.

## 2. සමස්ත සෞභාග්‍යය

2009 සිට 2011 දක්වා ශ්‍රී ලංකාවේ සෞභාග්‍ය දර්ශකය සහ එහි උප දර්ශක තුන සංඛ්‍යා සටහන 1 හි දක්වා ඇත. එම කාලය තුළ සියලුම උප දර්ශකවල දියුණුවක් ද සමග ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය වර්ධනය වී ඇත. 2010 වසරේ දී සියයට 3.1 ක වර්ධනයක් පෙන්වූ ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය 2011 වර්ෂය තුළ සියයට 4.1 කින් වර්ධනය විය. 2009 සිට 2011 කාලය තුළ වඩාත් පැහැදිලි දියුණුවක් පෙන්නුම් කළ සමාජ ආර්ථික යටිතල පහසුකම් පිළිබඳ උප දර්ශකය 2010 වසරේ දී සියයට 3.7 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, 2011 වසරේ දී එහි වර්ධනය සියයට 4.9 දක්වා ඉහළ ගොස් තිබිණි. 2010 දී සියයට 2.1 ක්ව පැවති ආර්ථික හා ව්‍යාපාරික පරිසරය පිළිබඳ උප දර්ශකයේ වර්ධනය 2011 වනවිට සියයට 4.0 දක්වා ඉහළ නැග තිබිණි. ජන ජීවිතයේ යහපැවැත්ම පිළිබඳ උප දර්ශකය ද 2010 තුළ දී සියයට 3.7 කින් වර්ධනය වී ඇති අතර, එය 2011 දී සියයට 3.6 කින් වර්ධනය වී තිබිණ.

**සංඛ්‍යා සටහන 1**

**ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය 2009 – 2011**

| | 2009 | 2010 | 2011 |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය | 56.5 | 58.2 | 60.6 |
| ආර්ථිකය හා ව්‍යාපාරික පරිසරය උප දර්ශකය | 66.0 | 67.4 | 70.1 |
| ජන ජීවිතයේ යහ පැවැත්ම උප දර්ශකය | 52.5 | 54.4 | 56.4 |
| සමාජ ආර්ථික යටිතල පහසුකම් උප දර්ශක | 50.9 | 52.8 | 55.4 |

2009 සිට 2011 දක්වා ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයේ සහ එහි උප දර්ශකයන්හි හැසිරීම රූප සටහන 1 හි පෙන්වා ඇත. එම කාලසීමාවේ දී සියලුම උප දර්ශකයන් වර්ධනයක් පෙන්වා තිබෙන අතර, ආර්ථිකය හා ව්‍යාපාරික පරිසරය පිළිබඳ උප දර්ශකය හා සමාජ ආර්ථික යටිතල පහසුකම් පිළිබඳ උප දර්ශකය වඩාත් ඉහළ වර්ධන වේගයක් පෙන්නුම් කර ඇත. විශේෂයෙන්ම, අදාළ කාලය තුළ බස්නාහිර පළාත හා අනෙකුත් පළාත් අතර ඇති විෂමතාවයේ අඩුවීමක් දක්නට ඇත. (සංඛ්‍යා සටහන 2)

**රූප සටහන 1**

**ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය 2009 – 2011**



**සංඛ්‍යා සටහන 2**

**සෞභාග්‍ය දර්ශකයන් බස්නාහිර පළාතේ ප්‍රතිශතයක් ලෙස: 2009 - 2011**

| පළාත | 2009 | 2010 | 2011 |
|---|---|---|---|
| බස්නාහිර | 100.0 | 100.0 | 100.0 |
| මධ්‍යම | 75.5 | 77.1 | 76.6 |
| දකුණ | 78.7 | 78.6 | 78.8 |
| උතුර | 67.8 | 70.4 | 73.1 |
| නැගෙනහිර | 69.2 | 72.5 | 71.8 |
| වයඹ | 73.8 | 74.9 | 75.0 |
| උතුරු මැද | 70.5 | 72.1 | 72.2 |
| ඌව | 70.5 | 71.5 | 71.6 |
| සබරගමුව | 71.7 | 73.3 | 73.4 |
| **බස්නාහිර පළාත හැර සියලුම පළාත්** | **72.2** | **73.8** | **74.1** |

## 3. පළාත්බද සෞභාග්‍යය

2009 සිට 2011 දක්වා පළාත් නමය සඳහා සෞභාග්‍යය දර්ශකය සංඛ්‍යා සටහන 3 හි ඉදිරිපත් කර ඇත. 2007, 2009 සහ 2011 වර්ෂයන් සඳහා පළාත් අනුව ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය රූප සටහන 2 හි පෙන්වා ඇත. උප දර්ශක තුනෙහි සංචලනයන් 4, 5 හා 6 සංඛ්‍යා සටහන් මගින් ඉදිරිපත් කර ඇත.

2009 – 2011 කාල පරාසය තුළ සියලුම පළාත්වල සෞභාග්‍ය දර්ශකයන් හා එහි උප දර්ශකයන්හි වර්ධනක් පෙන්නුම් කර ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයෙහි ඉදිරියෙන්ම සිටින පළාත් පහ පිළිවෙළින්; බස්නාහිර, දකුණු, මධ්‍යම, වයඹ හා සබරගමුව වේ. 2009 දී නම වන ස්ථානයේ සිටි උතුරු පළාත, වැඩිම වර්ධන වේගයක් වාර්තා කරමින්, 2011 වසරේ දී හය වන

ස්ථානයට පත් විය. සෑම පළාතකම සෞභාග්‍ය තත්ත්වයන් පසුගිය වසරවල දී අඛණ්ඩව වැඩි වුවද, අනෙකුත් පළාත්වලින් දක්නට ලැබුණු වඩා ඉහළ වර්ධනයන් හේතුවෙන් සමහර පළාත්වල ස්ථානයන්හි පසුබැසීමක් නිරීක්ෂණය කළ හැක.

**සංඛ්‍යා සටහන 3**

**පළාත් සඳහා සෞභාග්‍ය දර්ශකය: 2009 - 2011**

| පළාත | 2009 | | 2010 | | වර්ධනය | 2011 | | වර්ධනය |
|---|---|---|---|---|---|---|---|---|
| | දර්ශකය | ශ්‍රේණිය | දර්ශකය | ශ්‍රේණිය | 2010/09 | දර්ශකය | ශ්‍රේණිය | 2011/10 |
| බස්නාහිර | 72.2 | 1 | 73.5 | 1 | 1.9 | 76.1 | 1 | 3.5 |
| මධ්‍යම | 54.5 | 3 | 56.7 | 3 | 4.1 | 58.3 | 3 | 2.9 |
| දකුණ | 56.8 | 2 | 57.8 | 2 | 1.8 | 60.0 | 2 | 3.7 |
| උතුර | 48.9 | 9 | 51.8 | 9 | 5.8 | 55.6 | 6 | 7.5 |
| නැගෙනහිර | 50.0 | 8 | 53.3 | 6 | 6.7 | 54.6 | 8 | 2.5 |
| වයඹ | 53.3 | 4 | 55.1 | 4 | 3.4 | 57.1 | 4 | 3.7 |
| උතුරු මැද | 50.9 | 7 | 53.0 | 7 | 4.3 | 54.9 | 7 | 3.5 |
| ඌව | 50.9 | 6 | 52.6 | 8 | 3.4 | 54.5 | 9 | 3.6 |
| සබරගමුව | 51.8 | 5 | 53.9 | 5 | 4.1 | 55.8 | 5 | 3.6 |
| **ශ්‍රී ලංකාව** | **56.5** | | **58.2** | | **3.1** | **60.6** | | **4.1** |

රූප සටහන 2 හි දැක්වෙන පරිදි 2009, 2010 හා 2011 වර්ෂයන්හි දී සමස්ත දිවයිනෙහි සහ සියලුම පළාත්වල සෞභාග්‍ය දර්ශකයෙහි යහපත් වර්ධනයක් නිරීක්ෂණය කළ හැක.

රූප සටහන 2

**පළාත් අනුව ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය - 2009, 2010 සහ 2011**




සෑම පළාතකටම අදාළ, සෞභාග්‍ය දර්ශකයේ විශේෂ ලක්ෂණ පහත සැකෙවින් විස්තර කර ඇත.

**බස්නාහිර පළාත** ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයේ ඉහළම අගය අඛණ්ඩව පවත්වාගෙන ඇති අතර, සමස්ත දිවයින සඳහා වන ජාතික සාමාන්‍ය අගයට වඩා ඉහළින් පවතින එකම පළාත ද වේ. 2011 වසරේ දී, බස්නාහිර පළාත සියයට 3.5 ක වර්ධන වේගයක් සෞභාග්‍ය දර්ශකය සඳහා අත්කරගත් අතර, උප දර්ශක තුනෙහි ද ඉහළම ස්ථාන ලබා ඇත. මෙහි විචල්‍යයන් සම්බන්ධයෙන් ගත් විට, ඒක පුද්ගල ද.දේ.නි., දුගී කුටුම්බයන්හි අඩුවීම, වාහන හිමිකම, දුරකථන ඝනත්වය සහ පරිගණක පහසුකම් හා ඉංග්‍රීසි මාධ්‍ය පංති ඇති පාසල් යන අංශවල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කෙසේ නමුත්, 2009 - 2011 කාලපරිච්ඡේදයේ දී

බස්නාහිර පළාතේ සිසු/ගුරු අනුපාතය හා වාර්තාගත අපරාධ සංඛ්‍යාව අනෙකුත් පළාත්වලට වඩා ඉහළ අගයක් ගන්නා ලදී.

**දකුණු පළාත** ආර්ථිකය හා ව්‍යාපාරික පරිසරය සහ සමාජ ආර්ථික යටිතල පහසුකම් යන උප දර්ශක දෙකෙහි ඉහළ අගයන් පෙන්නුම් කරන අතරම සෞභාග්‍ය දර්ශකයේ තම ශ්‍රේණිය දෙවන ස්ථානයේ පවත්වා ගැනීමට සමත්ව ඇත. වර්ධනයක් පෙන්වූ අංශ අතර ඒක පුද්ගල ද.දේ.නි., බැංකු ඝනත්වය, අ.පො.ස. (සා.පෙ.) සමත් අනුපාතය සහ ඉංග්‍රීසි මාධ්‍ය පංති, පිරිසිදු පානීය ජල පහසුකම් හා පරිගණක පහසුකම් සහිත පාසල් යන අංශ කැපී පෙනුණු අතර, 2011 වසරේ දී අනෙකුත් පළාත් සමග සංසන්දනය කළ විට දකුණු පළාත් උද්ධමනයේ ඉහළ වැඩිවීමක් දක්නට ලැබුණි.

2011 වසරේ දී **මධ්‍යම පළාත** සෞභාග්‍ය දර්ශකයේ වර්ධන වේගයේ අඩුවීමක් පෙන්නුම් කළ නමුත් දර්ශකයේ තම ශ්‍රේණිය තුන්වන ස්ථානයේ පවත්වා ගැනීමට සමත්ව ඇත. කෙසේ වෙතත්, පාසල් ඝනත්වය, සුපිරි වෙළෙඳසැල් ඝනත්වය, මහාමාර්ග ඝනත්වය යන අංශවලින් වාර්තා වූ ඉහළ මට්ටම් සහ වාර්තාගත අපරාධවල පෙන්නුම් කළ අඩුවීම යන හේතූන් මත ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජ ආර්ථික යටිතල පහසුකම් යන උප දර්ශකවලින් ඉහළ ස්ථාන ලබාගැනීමට සමත්ව ඇත. කෙසේ වෙතත්, අවිධිමත් අංශයේ පහළ වැටුප් හා ඉහළ පළාත් උද්ධමනය හේතුවෙන් එම පළාත ආර්ථිකය හා ව්‍යාපාරික පරිසරය යන උප දර්ශකයේ පහළ ස්ථානයක් ලබා ඇත.

**වයඹ පළාත** සෞභාග්‍ය දර්ශකයේ හා එහි ප්‍රධාන උප දර්ශක තුනෙහි සිව්වන ස්ථානයෙහි ශ්‍රේණිගත වී ඇත. ඒක පුද්ගල ද.දේ.නි., කර්මාන්ත ඝනත්වය, අ.පො.ස. (සා.පෙ.) සමත් අනුපාතය, වාහන හිමිකම, විදුලි පරිභෝජනය සහ පිරිසිදු පානීය ජල පහසුකම් යන අංශවලින් පෙන්නුම් කළ වර්ධනය මෙහි ඉහළ ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රධාන හේතු ලෙස දැක්විය හැක. කෙසේ වෙතත්, අනෙකුත් පළාත් සමග සංසන්දනය කිරීමේ දී පළාත් උද්ධමනය, ද්විතීයික අධ්‍යාපනයේ

නියැලීම සහ පරිගණක පහසුකම් සහිත පාසල් යන අංශවල පහළ ක්‍රියාකාරිත්වයන් වයඹ පළාතින් නිරීක්ෂණය කළ හැකි විය.

**සබරගමු පළාත** සැලකූ විට, පාසල් ඝනත්වය, සිසු/ගුරු අනුපාතය, මහාමාර්ග ඝනත්වය සහ පිරිසිදු පානීය ජල පහසුකම් යන අංශවල වර්ධනය හේතුවෙන් ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජ ආර්ථික යටිතල පහසුකම් යන උප දර්ශක දෙකෙහි ඉහළ ක්‍රියාකාරිත්වයක් පෙන්වමින් සෞභාග්‍ය දර්ශකයේ පස්වන ස්ථානයෙහි රැඳී සිටීමට සමත්ව ඇත. කෙසේ වුවත්, අනෙකුත් පළාත් සමග සැසඳීමේ දී ඒක පුද්ගල ද.දේ.නි., අවිධිමත් අංශයේ වැටුප් සහ බැංකු ඝනත්වය යන අංශ පහළ අගයක පැවතීම හේතු කොට ගෙන ආර්ථිකය හා ව්‍යාපාරික පරිසරය යන උප දර්ශකයේ පහළ ක්‍රියාකාරිත්වයක් පෙන්වා ඇත.

**උතුරු පළාත** ගත් කල, ප්‍රධාන වශයෙන් ඒක පුද්ගල ද.දේ.නි., බැංකු ඝනත්වය, මහාමාර්ග ඝනත්වය සහ ඉංග්‍රීසි මාධ්‍ය පංති හා පරිගණක පහසුකම් ඇති පාසල් යන අංශවල පෙන්නුම් කළ වර්ධනය හේතුවෙන් 2011 වසරේ දී සෞභාග්‍ය දර්ශකයේ ඉහළම වර්ධන වේගය උතුරු පළාතින් පෙන්නුම් කළ අතර, එම දර්ශකයේ 2010 දී අත්පත් කරගත් නම වන ස්ථානයේ සිට 2011 වසරේ දී හය වන ස්ථානය දක්වා වැඩිදියුණු කර ගන්නා ලදී. එසේම, අනෙකුත් පළාත් හා සැසඳීමේ දී අ.පො.ස. (සා.පෙ.) සමත් අනුපාතයේ පහළ අගයක් සහ වාර්තාගත අපරාධ සංඛ්‍යාවේ ඉහළ යාමක් පෙන්නුම් කෙරේ.

**උතුරු මැද පළාත** සෞභාග්‍ය දර්ශකයේ හත්වන ස්ථානයේ රැඳී සිටින අතර, 2011 වසරේ දී එහි වර්ධන වේගය පහළ යාමක් පෙන්නුම් කර ඇත. මෙහි උප දර්ශක තුන සැලකූ විට, සේවා නියුක්තිය හා අවිධිමත් අංශයේ වැටුප් යන අංශවල සිදුවූ වර්ධනයන් හේතුවෙන් ආර්ථිකය හා ව්‍යාපාරික පරිසරය යන උප දර්ශකයේ ක්‍රියාකාරිත්වය අනෙකුත් උප දර්ශක දෙකෙහි ක්‍රියාකාරිත්වයට වඩා හොඳ තත්ත්වයක් පෙන්නුම් කර ඇත. එසේම, අනෙකුත් පළාත් හා සැසඳීමේ දී උතුරු මැද පළාතේ පාසල් ඝනත්වය, ඉංග්‍රීසි මාධ්‍ය පංති සහිත පාසල්, මහාමාර්ග ඝනත්වය හා පිරිසිදු පානීය ජල පහසුකම් යන අංශවල පහළ ක්‍රියාකාරිත්වයක්

පෙන්නුම් කරන අතර, එය අනෙකුත් උප දර්ශක දෙකෙහි ශ්‍රේණි පහළ යාමට ද බලපෑමක් ඇති කර ඇත.

අනෙකුත් පළාත් සමග සැසඳීමේ දී **නැගෙනහිර පළාතේ** සේවා නියුක්තිය, දුගී නිවාස ප්‍රතිශතය, ද්විතීයික අධ්‍යාපනයේ නියැලීම, අ.පො.ස. (සා.පෙ.) සමත් අනුපාතය සහ විදුලි සංදේශ හා පරිගණක පහසුකම් යන අංශවලින් දක්නට ලැබුණු පහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන්, සෞභාග්‍ය දර්ශකයේ පහළම වර්ධන වේගය නැගෙනහිර පළාත පෙන්නුම් කළ අතර, එහි ස්ථානය 2010 පැවති හයවන ස්ථානයේ සිට 2011 දී අටවන ස්ථානය දක්වා පහළ ගොස් ඇත. එමෙන්ම එහි උප දර්ශකයන් තුනම පහළ ස්ථාන පෙන්නුම් කරන අතර, සමාජ ආර්ථික යටිතල පහසුකම් උප දර්ශකය පහළම ස්ථානය පෙන්නුම් කරයි.

**ඌව පළාත** මෙම දර්ශකයේ නමවන ස්ථානය දක්වා පහළ බැස ඇති අතර, අනෙකුත් පළාත් හා සැසඳීමේ දී අවිධිමත් අංශයේ වැටුප්, කර්මාන්ත ඝනත්වය, විශ්වවිද්‍යාල සඳහා ඇතුළත්වීම්, අ.පො.ස. (සා.පෙ.) සමත් අනුපාතය, පාසල් ඝනත්වය සහ පිරිසිදු පානීය ජල පහසුකම් යන අංශවල පෙන්නුම් කළ පහළ ක්‍රියාකාරිත්වය මෙම පහළ යාමට ප්‍රධාන හේතු ලෙස පෙන්වා දිය හැක. ආර්ථික හා ව්‍යාපාරික පරිසරය සහ ජන ජීවිතයේ යහපැවැත්ම යන උප දර්ශකයන් සමාජ ආර්ථික යටිතල පහසුකම් උප දර්ශකයට සාපේක්ෂව පහළ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරයි.

## සංඛ්‍යා සටහන 4

## ආර්ථිකය හා ව්‍යාපාරික පරිසරය උප දර්ශකය 2009 – 2011

| පළාත | 2009 | | 2010 | | වර්ධනය | 2011 | | වර්ධනය |
|---|---|---|---|---|---|---|---|---|
| | දර්ශකය | ශ්‍රේණිය | දර්ශකය | ශ්‍රේණිය | 2010/09 | දර්ශකය | ශ්‍රේණිය | 2011/10 |
| බස්නාහිර | 80.9 | 1 | 83.4 | 1 | 3.1 | 86.0 | 1 | 3.1 |
| මධ්‍යම | 60.5 | 5 | 61.5 | 5 | 1.7 | 62.3 | 7 | 1.2 |
| දකුණ | 62.7 | 2 | 64.2 | 2 | 2.4 | 66.7 | 2 | 3.9 |
| උතුර | 56.1 | 9 | 59.5 | 8 | 6.1 | 62.8 | 6 | 5.6 |
| නැගෙනහිර | 59.5 | 6 | 61.4 | 6 | 3.3 | 63.3 | 5 | 3.0 |
| වයඹ | 61.1 | 4 | 62.2 | 4 | 1.8 | 64.0 | 4 | 2.9 |
| උතුරු මැද | 61.5 | 3 | 63.5 | 3 | 3.2 | 65.4 | 3 | 3.0 |
| ඌව | 57.1 | 8 | 58.6 | 9 | 2.6 | 60.4 | 9 | 3.1 |
| සබරගමුව | 57.8 | 7 | 60.1 | 7 | 3.9 | 61.8 | 8 | 2.9 |
| **ශ්‍රී ලංකාව** | **66.0** | | **67.4** | | **2.1** | **70.1** | | **4.0** |

## සංඛ්‍යා සටහන 5

## ජන ජීවිතයේ යහ පැවැත්ම උප දර්ශකය 2009 - 2011

| පළාත | 2009 | | 2010 | | වර්ධනය | 2011 | | වර්ධනය |
|---|---|---|---|---|---|---|---|---|
| | දර්ශකය | ශ්‍රේණිය | දර්ශකය | ශ්‍රේණිය | 2010/09 | දර්ශකය | ශ්‍රේණිය | 2011/10 |
| බස්නාහිර | 66.4 | 1 | 67.4 | 1 | 1.5 | 70.4 | 1 | 4.4 |
| මධ්‍යම | 51.9 | 2 | 53.8 | 2 | 3.8 | 54.6 | 2 | 1.4 |
| දකුණ | 51.5 | 3 | 51.3 | 5 | -0.4 | 53.0 | 5 | 3.4 |
| උතුර | 45.1 | 9 | 50.7 | 6 | 12.6 | 54.0 | 3 | 6.5 |
| නැගෙනහිර | 46.6 | 6 | 51.6 | 4 | 10.8 | 52.4 | 6 | 1.6 |
| වයඹ | 50.4 | 4 | 51.8 | 3 | 2.7 | 53.6 | 4 | 3.4 |
| උතුරු මැද | 45.1 | 8 | 46.8 | 9 | 3.7 | 48.7 | 9 | 4.0 |
| ඌව | 45.5 | 7 | 48.0 | 8 | 5.5 | 49.5 | 8 | 3.1 |
| සබරගමුව | 48.8 | 5 | 50.3 | 7 | 3.2 | 52.2 | 7 | 3.7 |
| **ශ්‍රී ලංකාව** | **52.5** | | **54.4** | | **3.7** | **56.4** | | **3.6** |

## සංඛ්‍යා සටහන 6

## සමාජ ආර්ථික යටිතල පහසුකම් උප දර්ශකය 2009 – 2011

| පළාත | 2009 | | 2010 | | වර්ධනය | 2011 | | වර්ධනය |
|---|---|---|---|---|---|---|---|---|
| | දර්ශකය | ශ්‍රේණිය | දර්ශකය | ශ්‍රේණිය | 2010/09 | දර්ශකය | ශ්‍රේණිය | 2011/10 |
| බස්නාහිර | 69.2 | 1 | 69.8 | 1 | 0.9 | 71.9 | 1 | 3.1 |
| මධ්‍යම | 51.0 | 3 | 54.7 | 3 | 7.1 | 58.1 | 3 | 6.3 |
| දකුණ | 56.1 | 2 | 57.9 | 2 | 3.2 | 60.1 | 2 | 3.8 |
| උතුර | 45.7 | 8 | 45.1 | 9 | -1.3 | 50.0 | 8 | 11.1 |
| නැගෙනහිර | 43.8 | 9 | 46.9 | 8 | 7.0 | 48.2 | 9 | 2.8 |
| වයඹ | 48.2 | 6 | 51.1 | 6 | 6.0 | 53.8 | 4 | 5.1 |
| උතුරු මැද | 45.9 | 7 | 48.8 | 7 | 6.2 | 50.6 | 7 | 3.8 |
| ඌව | 50.1 | 4 | 51.2 | 5 | 2.3 | 53.6 | 5 | 4.6 |
| සබරගමුව | 48.7 | 5 | 51.2 | 4 | 5.2 | 53.5 | 6 | 4.5 |
| **ශ්‍රී ලංකාව** | **50.9** | | **52.8** | | **3.7** | **55.4** | | **4.9** |

## සංඛ්‍යා සටහන 7

## ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයේ විචල්‍යයන්

| උප දර්ශකය | | අංකය | විචල්‍යයන් |
|---|---|---|---|
| **ආර්ථිකය හා ව්‍යාපාරික පරිසරය** | ආර්ථිකය | 1. | ඒක පුද්ගල ද.දේ.නි. |
| | | 2. | සේවා නියුක්ති අනුපාතය |
| | | 3. | අවිධිමත් අංශයේ වැටුප් |
| | | 4. | දුගී කුටුම්බ ප්‍රතිශතය |
| | | 5. | සමස්ත දිවයින/පළාත් පාරිභෝගික මිල දර්ශකය (පළාත් උද්ධමනය) |
| | ව්‍යාපාරික පරිසරය | 6. | කර්මාන්තශාලා ගණන, පුද්ගලයන් 1,000 කට (ඝනත්වය) |
| | | 7. | බැංකු ශාඛා ගණන, පුද්ගලයන් 100,000 කට (ඝනත්වය) |
| **ජන ජීවිතයේ යහපැවැත්ම** | සෞඛ්‍යය | 8. | රාජ්‍ය ආරෝග්‍යශාලා ඇඳන් ගණන, පුද්ගලයන් 1,000 කට |
| | | 9. | රාජ්‍ය වෛද්‍ය නිලධාරීන් ගණන, පුද්ගලයන් 100,000 කට |
| | | 10. | අඩු බර සහිත උපත් සංඛ්‍යාව, සජීවී උපත් 1,000 කට |
| | අධ්‍යාපනය | 11. | වර්ග කිලෝ මීටරයකට ඇති පාසල් සංඛ්‍යාව (ඝනත්වය) |
| | | 12. | සිසු/ගුරු අනුපාතය |
| | | 13. | ද්විතීයික අධ්‍යාපනයේ නියැලීම |
| | | 14. | අ.පො.ස. (සා.පෙ.) සමත් අනුපාතය සහ විශ්වවිද්‍යාල ඇතුළත්වීම්, පුද්ගලයන් 100,000 කට |
| | | 15. | ඉංග්‍රිසි මාධ්‍ය පංති සහිත පාසල් ප්‍රතිශතය |
| | ධනය | 16. | වාහන සංඛ්‍යාව, පුද්ගලයන් 1,000 කට (වාහන හිමිකම) |
| | | 17. | සුපිරි වෙළෙඳසැල් සංඛ්‍යාව, පුද්ගලයන් දශ ලක්ෂයකට (ඝනත්වය) |
| | විනෝදය | 18. | මසකට සාමාන්‍ය සිනමා ප්‍රේක්ෂකයින් සංඛ්‍යාව, මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස |
| | පරිසරයේ ගුණාත්මක බව | 19. | ශ්වසන රෝග සඳහා ප්‍රතිකාර ලැබූවන් සංඛ්‍යාව, පුද්ගලයන් 1,000 කට |
| | | 20. | ඒක පුද්ගල මදුරු දහර පරිභෝජනය |
| **සමාජ ආර්ථික යටිතල පහසුකම්** | | 21. | ඒක පුද්ගල විදුලි පරිභෝජනය |
| | | 22. | දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව, පුද්ගලයන් 1,000 කට (ඝනත්වය) |
| | | 23. | මහාමාර්ග ඝනත්වය |
| | | 24. | වාර්තාගත අපරාධ සංඛ්‍යාව, පුද්ගලයන් 1,000 කට (ඝනත්වය) |
| | | 25. | පිරිසිදු පානීය ජල පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය |
| | | 26. | පරිගණක පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය |